# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2023.07.21

වේලාව : ප.ව. 1.00

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මූලාසනය : **ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)**

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් (බ.ප.) |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප) |
| 04) | සිරිසෝම ලෙකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප) |
| 05) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප) |
| 06) | ගාමිණී ධර්මසේන මහතා | - | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප) |
| 07) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප) |
| 08) | චන්දන රණවීර ආරච්චි මයා | - | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) |
| 09) | ඩබ්ලිව්.එම්.දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 10) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 11) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 12) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 13) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 14) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 15) | පේෂලා අබේසූරිය මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 16) | අශා පනාගොඩ මිය | - | අධ්‍යක්ෂ (ඉංජිනේරු) |
| 17) | ඩී.ඩී.සී.සෙනවිරත්න මිය | - | අභ්‍යන්තර විගණක |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | කාර්ය සාධන තරගාවලිය සම්බන්ධව මෙතෙක් සිදුකර ඇති කාර්යයන් සම්බන්ධව ඉදිරිපත් කිරීමක් සමඟ සහකාර ප්‍රධාන ලේකම් (පාලන) විසින් සමාලෝචනය කරන ලදී.ඒ අනුව බස්නාහිර පළාත් සභාවට අයත් ආයතන 1810 කින් ආයතන 1492 ක් මෙම තරඟාවලිය සඳහා ලියාපදිංචි වී ඇති අතර ඉන් දෙවන අදියර සඳහා ආයතන 1399 ක් සුදුසුකම් ලබා ඇති බවත් ඉන් 1005 ක Google form ලැබී ඇති බවට හා ලකුණු මට්ටම් ලබා දීම සම්බන්ධව සහකාර ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු පැහැදිලි කරන ලදී.<br><br>ඒ අනුව ආයතන 1810 කින් මෙම තරඟය සඳහා ඉදිරිපත් වූ ආයතන 1492 ට අමතරව ඉතිරිව ඇති අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් අනිකුත් ආයතන සඳහා වෙනම වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි දන්වා ඇති අතර ඒ සම්බන්ධව වාර්තාවක් තමා වෙත ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දෙන ලදී.තවද මෙම ආයතන වෙනම කැඳවා ඔවුන් කාර්ය සාධන තරඟාවලිය සඳහා ඉදිරිපත් නොවීම සම්බන්ධව හේතු විමසන බව ගරු ආණ්ඩුකාරතුමා විසින් දන්වා ඇති බවත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් දැනුම් දෙන ලදී.<br><br>තවද ආයතන විසින් ලබාගත් ලකුණු මට්ටම් පිළිබඳ Google form ලබා දීමට දී තිබූ කාල සීමාව දීර්ඝ කර දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත්ව ඇති අතර මේ වන විට ආයතන 1005 ක පමණක් තොරතුරු එවා ඇති බැවින් ලබා දී තිබුණු අවසාන දිනය 2023.07.25 දින දක්වා දීර්ඝ කිරිමට තීරණය කළ අතර 2023.08.02 දින වන විට පළමු අදියරේ සියලු කටයුතු නිමා කර තොරතුරු ඉදිරිපත් කල යුතු බැවින් එම දින වන විට  Google form ලබා දීම අවසන් කරන ලෙස දන්වන ලදී.<br><br>තවද කාර්ය සාධන තරඟාවලිය අනවශ්‍ය බරක් ලෙස නොගෙන මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන සියලුම කාර්යාලවල කටයුතු පිළිවෙලකට සිදුකර ගැනිමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් සියලුම ලේකම්වරුන් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>කාර්ය සාධන තරඟාවලියේ අවසාන ඇගයීම සිදු කිරීම සඳහා නොවැම්බර් මස අවසානයේ හෝ දෙසැම්බර් මස මුලදී ගරු ආණ්ඩුකාරතුමාගෙන් දිනයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ආණ්ඩුකාර ලේකම් වෙත ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>එමෙන්ම කාර්ය සාධන තරඟාවලිය අවසානයේ අවම ලකුණු ලබාගත් ආයතන වලින් එසේ සිදු වීමට හේතු විමසන බවට ගරු ආණ්ඩුකාරතුමා විසින් දැනුම් දුන් බවද ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>ආණ්ඩුකාර ලේකම්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 02 | මෙතෙක් ක්‍රියාත්මක නොවූ ස්ථාන මාරු සම්බන්ධව | කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාවල අනුප්‍රාප්තිකයෙකු නම් නොකිරීම මත නිලධාරීන් නිදහස් කල නොහැකි බව පවසා ස්ථාන මාරු ක්‍රියාත්මක නොවීමේ ගැටළුවක් පවතින බවත් එම ස්ථාන මාරු ක්‍රියාත්මක වන තෙක් ඔවුන්ගේ වැටුප් නවතන ලෙස දන්වා ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී කිසිදු අවස්ථාවක අනුප්‍රාප්තිකයෙකු රහිතව ස්ථාන මාරු ලබා දීමට කටයුතු නොකරන අතර ස්ථාන මාරු ලබා දුන් අවස්ථාවල අදාළ සේවා ස්ථාන වලට වාර්තා නොකරන සියලු නිලධාරීන්ගේ වැටුප් නතර කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 03 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අදහස් දක්වමින් අධ්‍යාපන ,සෞඛ්‍ය , පළාත් පාලන හා ප්‍රවාහන යන අමාත්‍යාංශවල ඉහළ ප්‍රගතියක් දක්නට ලැබෙන නමුත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රගතිය අවම මට්ටමක පවතින බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව මහ කන්නයේ වගා කටයුතු සම්බන්ධව පවතින ගැටළු හා මෙම වසරේ විශාල ප්‍රමාණයක් වාරිමාර්ග සම්බන්ධ ඉදිකිරීම් පවතින බවත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් හේතු ඉදිරිපත් කරන ලදී.<br>ඉදිරි සතියේදී ගරු ආණ්ඩුකාරතුමාගෙන් දිනයක් වෙන් කරගෙන වාරිමාර්ග හා අනිකුත් ඉදිකිරීම් කටයුතු සම්බන්ධව සාකච්ඡා කිරීමට සුදුසු බව සාකච්ඡා කරන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 04 | සමූහ ජීවිත රක්ෂණාවරණය සම්බන්ධව | සමූහ ජීවිත රක්ෂණාවරණය පවත්වාගෙන යාම සඳහා අවම 1500ක පිරිසක් සාමාජිකත්වය ලබා සිටිය යුතු නමුත් දැනට සාමාජිකත්වය ලබා සිටින පිරිස 300 ක් පමණ වන අතර ඉන් ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධව ආයතනවල ප්‍රධානීන් දැනුවත් නොමැති බැවින් ඒ පිළිබඳ ලේකම්වරුන් දැනුවත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>එම ජීවිත රක්ෂණාවරණය ලබා ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර ජීවිත රක්ෂණාවරණය සිදු කරණ ශ්‍රී ලංකා ජාතික රක්ෂණ සංස්ථාවේ නිලධාරියෙකු කැඳවා ලබා දෙන ප්‍රතිලාභ සම්බන්ධව ඉදිරිපත් කිරීමක් මගින් නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස සහ ආයතන වලින් එම වැඩසටහන සඳහා සුදුසු නිලධාරියෙකු සම්බන්ධ කිරීමට කටයුතු කරන ලෙස දන්වන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 05 | බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාල පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය තුල ස්ථාපිත කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයෙන් පිටත ඇති වෙනත් ආයතනවලට අයත් ගොඩනැගිලිවල කුලී පදනම මත පවත්වාගෙන යන කාර්යාල බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුල ස්ථාපිත කිරීම සම්බන්ධව අධ්‍යයනය කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් ගරු ආණ්ඩුකාරතුමා විසින් පත්කර ඇති අතර එමඟින් ගොඩනැගිලි පරිශ්‍රයෙහි ඉඩකඩ පවතින ස්ථාන පිළිබඳ පරීක්ෂා කරමින් පවතින බව ප්‍රධාන ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>කමිටු වාර්තාව ලද පසු කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිලි වල පවත්වාගෙන යන කාර්යාල මෙම වසරේදීම පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට පියවර ගන්නා බවද ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් දන්වා සිටින ලදී.<br><br>මේ වන විට ආයුර්වේද දෙපාර්තමේන්තුව, ව්‍යාපාර නාම රෙජිස්ටාර් කාර්යාලය හා ඉඩම් කොමසාරිස් කාර්යාලය ප්‍රමුඛතාවය ලබා දිය යුතු කාර්යාල ලෙස හඳුනාගෙන ඇත. අධීක්ෂණය පහසු වීම සඳහා ව්‍යාපාර නාම රෙජිස්ටාර් කාර්යාලය අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපිත කර තිබූ පළමු මහලේ පිහිටි පරිශ්‍රයෙහි ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන බවත් සහ අනිකුත් කාර්යාල ස්ථාපිත කිරීම සම්බන්ධවත් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br><br>එමෙන්ම ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින් අත්පත් කර ගැනීම සඳහා හඳුනාගත් ඉඩමක් ඇති බවත් , ඉඩම් කොමසාරිස් කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා එය ලබා ගැනීම සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු විමසා සිටි අතර ඒ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 06 | කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධව | අමාත්‍යාංශ ලේකම්වරුන් හා අමාත්‍යාංශ යටතේ පවතින අනිකුත් ආයතනවල මාණ්ඩලික නිලධාරීන් අතර ද කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br>එහිදී කාර්ය සාධන ගිවිසුම හා කාර්ය සාධන සැලසුමේ තොරතුරු ගැලපිය යුතු බැවින් කාර්ය සාධන ගිවිසුමේ තොරතුරු කාර්ය සාධන වාර්තාව වෙත ඇතුලත් කර සකස් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු පැහැදිලි කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

4C



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 07 | දැනට භාවිතා නොකරන රජයේ නිල නිවාස සම්බන්ධව | රජයේ නිල නිවාස බොහොමයක් පදිංචියෙන් තොරව පවතින අතර සමහර නිල නිවාස අළුත් වැඩියාවකින් තොරව භාවිතා කල නොහැකි තත්ත්වයක් පවතී.ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡාකර මේ පිළිබඳ තීරණයක් ලබා ගත යුතු බැවින් සාකච්ඡාවක් සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් දිනයක් වෙන් කර ගන්නා ලෙස ආණ්ඩුකාර ලේකම් වෙත දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>ආණ්ඩුකාර ලේකම් |
| 08 | සේවා මුර ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධව | ආර්ථික අර්බුදය හමුවේ පැන නැගී ඇති අධි උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් ජීවන වියදම ඉහලයාම නිසා ආරක්ෂක සේවා නිලධාරීන්ගේ සේවා මුර ගාස්තු සංශෝධනය කිරීමට අදාළව ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය මඟින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br>මේ පිළිබඳ කරුණු සාකච්ඡා කළ අතර මෙය රජයේ ප්‍රතිපත්තියක් මත හෝ පඩි පාලක සභා ආඥා පනත අනුව ගත් තීරණයක් මත සිදු කරනු ලබන පඩි වැඩි වීමක් නොව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත එය සිදු කිරීමේ හැකියාවක් නොමැති බවට ප්‍රධාන නීති නිලධාරී විසින් කරුණු ඉදිරිපත් කළ අතර වසර මුලදී මේ සම්බන්ධ ගිවිසුමකට එළඹී ඇති බවත් වසර මැදදී මෙවැනි සංශෝධන සිදු කල නොහැකි බවට ප්‍රධාන ලේකම් විසින් අදහස් දක්වන ලදී.තවද වැඩි දුරටත් මේ පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා මෙම ඉල්ලීම් ලිපිය ප්‍රධාන නීති නිලධාරී වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>ප්‍රධාන නීති නිලධාරී |
| 09 | මහ නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් මහ නගර සැලැස්ම ක්‍රියාත්මක කිරීම (2024) සම්බන්ධව අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ලබා දී ඇති බවත් අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන ප්‍රධානීන් මේ පිළිබඳ දැනුවත් කර සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 10 | ජනමාධ්‍යයට අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධව | ජන මාධ්‍යයට තොරතුරු ලබා දීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ විධි විධාන සඳහන් කර ඇත. නමුත් එම නීති රීති උල්ලංඝනය කර තොරතුරු ලබා දී තිබීම හේතුවෙන් ගැටළු රැසක් ඇතිවී ඇති බවත්, ජනමාධ්‍යය වෙත බස්නාහිර පළාත් සභාව සම්බන්ධව තොරතුරු ලබා දීමේදී ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව අමාත්‍යාංශ ලේකම්වරුන් හා ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් එසේ නොමැතිව තොරතුරු ලබා දී පැන නඟින ගැටළු සම්බන්ධව පුද්ගලිකව වගකීමට බැඳෙන බවත් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

91



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 11 | 2024 අයවැය සම්බන්ධව | 2024 අයවැයට අදාළ පුනරාවර්තන වියදම් පිලිබඳ සාකච්ඡා කිරීමට දින වෙන්කර ගෙන ඇති බවත් ඒ සමඟම ප්‍රාග්ධන වියදම් සම්බන්ධවද සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.දිස්ත්‍රික් තුනට අදාළ ව්‍යාපෘති සඳහා වන සංවර්ධන සැලසුම් සියල්ල ලැබුණු පසු සාකච්ඡාවක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා එක් එක් අමාත්‍යංශ ලේකම්වරුන් විසින් තම අමාත්‍යංශයට අයත් ආයතනවල සංවර්ධන සැලසුම් සමාලෝචනය කර ප්‍රමුඛතාවය ලබා දිය යුතු අනුපිළිවලට සකස්කරගත යුතුය.ඒ අනුව එම එක් එක් ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දිය හැකි ප්‍රතිපාදන ප්‍රමාණය තීරණය කරගෙන ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර ලැබෙන අනුමැතිය අනුව ඉදිරි කටයුතු සිදු කරන බවට ප්‍රධාන ලේකම් විසින් පැහැදිලි කරන ලදී.<br><br>එමෙන්ම ප්‍රධාන ලේකම් සමඟ සාකච්ඡා කර 2024 අයවැයට අදාළ පුනරාවර්ථන වියදම් හා ප්‍රාග්ධන වියදම් සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා දින සඳහන් කරන ලද ලිපිය අමාත්‍යංශ ලේකම්වරු වෙත යොමුකර ඇති බවත් සියළුම අමාත්‍යංශ ලේකම්වරු , දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන ප්‍රධානීන් හා ගණකාධිකාරීවරුන් තොරතුරු අධ්‍යනය කර විධිමත්ව සූදානම්ව එම රැස්වීම් වලට සහභාගී වන ලෙසත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් දැනුවත් කළ අතර මෙම දිනයන් එම සාකච්ඡා සඳහා වෙන්කර තබා ගන්නා ලෙසද වැඩි දුරටත් දැනුම් දෙන ලදී.<br><br>තවද මෙම සාකච්ඡා සඳහා වෙන්කර ඇති වේලාවන් තුල ඒ සඳහා සහභාගී වීමට කටයුතු කරන ලෙසත් එම වේලාවන්ට සහභාගී නොවන ආයතන සඳහා නැවත සාකච්ඡා වාරයක් ලබා දීමට නොහැකි බවත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 12 | පවතින පුරප්පාඩු සඳහා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම | අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරු සඳහා නිලධාරීන් ඉදිරිපත් නොවීමේ ගැටළුව මත පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ ගැටළුවක් පවතී.<br>ඒ අනුව සුදුසුකම් පවතින නිලධාරීන් ඉදිරිපත් නොවුවහොත් විදුහල්පති සේවයේ නිලධාරීන් ඉදිරිපත් කිරීමේ හැකියාව පිළිබඳවත් සාකච්ඡා කරන ලදි | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 13 | ගිණුම් කාරක සභා තරඟාවලිය | ගිණුම් කාරක සභා තරඟාවලිය පසුගියදා පැවති අතර ඉදිරියේදී පැවැත්වීමට නියමිත 2021/2022 ගිණුම් කාරක සභා තරඟාවලිය සඳහා සූදානම් වීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.ඒ අනුව එක් එක් අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතන ලබාගෙන ඇති ලකුණු මට්ටම් කෙරෙහි වෙන වෙනම අවධානය යොමුකළ අතර අවම ලකුණු ලබාගෙන ඇති ආයතන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලෙසත් එම ආයතනවල ප්‍රධානීන් හා ගණකාධිකාරීවරුන් කැඳවා මෙසේ වීමට හේතු සාකච්ඡා කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කරන ලදී.<br><br>එමෙන්ම අභ්‍යන්තර විගණන විමසුමට මාසයක් ඇතුලත පිළිතුරු ලබා දිය යුතු බවත් එසේ නොවන අවස්ථාවලදී එය ලබා ගන්නා ලකුණු කෙරෙහි බලපාන අතර බස්නාහිර පළාත් සභාවට අයත් එක් ආයතනයක් එසේ පැහැර හැරීමේදී එය සමස්ත පද්ධතිය කෙරෙහිම බලපෑමක් වන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් සඳහන් කළ අතර ඒ පිළිබඳ ක්‍රියා කල යුතු ආකාරය පිළිබඳ සවිස්තරාත්මකව දැනුවත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 14 | ආණ්ඩුකාර කුසලාන තරඟාවලිය | බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපාදන හෝ රජයේ ප්‍රතිපාදන යොදා ගැනීමකින් තොරව ආණ්ඩුකාර කුසලාන තරඟාවලියට අදාළ කටයුතු අගෝස්තු මස අවසාන සතිය වන විට ආරම්භ කිරිමට අපේක්ෂා කෙරේ. ඉදිරියේදී මෙම තරඟ පැවැත්වීම සම්බන්ධ මාර්ගෝපදේශ නිකුත් කිරීමට බලාපොරොත්තුවන අතර බස්නාහිර පළාත් සභාවට අයත් ඕනෑම ආයතනයක සේවයේ නියුතු නිලධාරියකුට කණ්ඩායමක් වශයෙන් තරඟ ඉසව් සඳහා සහභාගී විය හැකි බවට ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් දැනුම් දෙන ලදී.ඒ සඳහා බස්නාහිර පළාත් සභාවට අයත් ආයතනයක කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයෙක් බවට ආයතන ප්‍රධානියා අනුමැතිය ලබාදී තිබිය යුතුය.<br><br>මෙම තරඟාවලි සඳහා විවිධ තරඟ ඉසව් ඇතුලත් වන අතර එක් එක් තරඟ සංවිධානය කිරීම ආයතන මට්ටමින් සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් තරඟ අවසානයේ 2023.12.12 දින "වර්ණ රාත්‍රිය" පැවැත්වීමට අදහස් කරන අතර මෙය හුදෙක් තරඟාවලියක් පමණක් නොව ආයතන අතර එකමුතුකම හා සහයෝගය වර්ධනය කිරීමේ අරමුණෙන් සංවිධානය කර ඇති බවත් මෙය සාර්ථක කර ගැනීම සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් ඉල්ලා සිටින ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 15 | බස්නාහිර පළාත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන අධීක්ෂණය සම්බන්ධව | බස්නාහිර පළාත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන අධීක්ෂණ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා නිරන්තරයෙන් විමසීමට ලක් කරනු ලබයි.ඒ අනුව අමාත්‍යාංශ යටතේ පවත්නා ප්‍රාදේශීය කාර්යාල සියල්ල අධීක්ෂණයට ලක් කිරීමට අමාත්‍යාංශ ලේකම්වරුන්ට ප්‍රායෝගිකව හැකියාවක් නොමැති අතර තමා යටතේ ඇති ආයතන අධීක්ෂණ කිරීම දෙපාර්තමේන්තු මට්ටමින් සිදුකල යුතුය.<br><br>තවද මෝටර් රථ දෙපාර්තමේන්තුව හා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව කෙරෙහි නිරන්තර චෝදනා එල්ලවන බව දක්නට ලැබෙන අතර එම දෙපාර්තමේන්තු සඳහා නිරන්තර අධීක්ෂණයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ප්‍රධාන ලේකම් විසින් පැහැදිලි කරන ලදී.<br><br>මෝටර් රථ දෙපාර්තමේන්තුව හා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අධීක්ෂණයට මාර්ගෝපදේශයක් ලබා දීම කෙරෙහි ගරු ආණ්ඩුකාරතුමා උපදෙස් ලබා දී ඇත.මේ වන විට එම මාර්ගෝපදේශ සංග්‍රහය කෙටුම්පත් කරමින් පවතින බවත් කෙටුම්පත සකස් කිරීමෙන් පසු පරීක්ෂා කිරීම සඳහා ප්‍රධාන නීති නිලධාරී වෙත ලබා දෙන බවත් ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. අනිකුත් ආයතන සම්බන්ධයෙන්ද සමීප අධීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන ලෙසත්, දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් සිදු කරනු ලබන විමර්ශනයන් සම්බන්ධව ගැටළු මතු වුවහොත් ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂ විමර්ශන කණ්ඩායම මඟින් විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කරන බව ගරු ආණ්ඩුකාරතුමා දැනුම් දී ඇති බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>ප්‍රධාන නීති නිලධාරී |
| 16 | බස්නාහිර පළාත් සභා පාසැල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ පාසැල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීමට තරඟ විභාග පැවැත්වීම පිළිබඳ සාකච්ඡා කරන ලදී.<br><br>ඒ අනුව 2020 ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගය සඳහා යොමුකළ සිංහළ මාධ්‍යට අයත් ඉල්ලුම් පත්‍ර 12170 ක් , දෙමළ මාධ්‍යට අයත් ඉල්ලුම් පත්‍ර 728 ක් , ඉංග්‍රීසි මාධ්‍යට අයත් ඉල්ලුම් පත්‍ර 508 ක් ,ලෙස ඉල්ලුම්පත්‍ර ලැබී ඇති බවත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>නව අයදුම්පත් කැඳවීමකදී මෙම අයටද අවස්ථාව ලබා දිය හැකිද යන්න සලකා බලන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත දන්වන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

40



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 17 | පළාත් පාලන ආයතනවල තනතුරු සඳහා පත්වීම් ලබා දීම සම්බන්ධව | පළාත් පාලන ආයතනවල තනතුරු සඳහා පත් කිරීමට අනුමැතියට ඉදිරිපත් කිරීමේදී වැඩ බලන තනතුරු සඳහා පත්කර කලක් ගත වූ පසු අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබයි.එවැනි අවස්ථාවල කොමිෂන් සභාව විසින් එම ඉල්ලුම් පත්‍ර සාකච්ඡාවට ලක් නොකරන බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br>තවද පරිපාලන නිලධාරීන් පත් කිරීමේදී පළාත් පාලන ආයතනවල පවතින පුරප්පාඩු ගණනය කිරීමට නිවැරදි තොරතුරු ඉදිරිපත් නොවන බවත් ඇතැම් පළාත් පාලන ආයතනවල ප්‍රධාන ලිපිකරු පරිපාලන නිලධාරී තනතුරට අදාළ කටයුතු ආවරණය කරන අතර , ඔවුන් එහි පවතින පුරප්පාඩු සම්බන්ධව නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකරයි.<br>තවද ප්‍රාදේශිය සභාවල ලේකම් තනතුර සඳහා පත්කල යුතු වන්නේ කළමනාකරණ සේවයේ අධි පන්තියේ නිලධාරියෙක් වුවද ඇතැම් කාර්යාලවල පරිපාලන නිලධාරියෙකු ප්‍රායෝගිකව එම තනතුරේ සේවයේ යෙදවීමට නොහැකිවන අවස්ථා වලදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා නිලධාරියෙකු විසින් එම රාජකාරී ආවරණය කරනු ලබයි.එම ලේකම්වරු ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වන අතර එම රාජකාරී ඉටු කිරීම සඳහා එම තනතුරු වලට පළාත් රාජ්‍ය කොමිෂන් සභාවේ අනුමැතිය හිමි නොවන අතර ප්‍රායෝගිකව සුදුසුකම් ඇති නිලධාරියෙකු යෙදවීමේ නොහැකියාව මත තමා දැඩි අපහසුතාවකට පත්ව ඇති බව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br>මේම තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනිමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී පවතින ප්‍රමාද දෝෂයන් මේ සම්බන්ධව බලපා ඇති බවට පළාත් රාජ්‍ය කොමිෂන් සභා ලේකම් විසින් කරුණු ඉදිරිපත් කළ අතර 2023.08.03 දින ඒ පිළිබඳ සාකච්ඡාකර එම ගැටළු නිරාකරණය කිරිම සඳහා කටයුතු කිරිමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා සහභාගීවන ලෙස පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී.<br>තවද ලේකම්වරු ඇතුළුව සියලුම ආයතන ප්‍රධානීන් ඉදිරි වර්ෂවල විශ්‍රාම ගන්නා නිලධාරීන් පිළිබඳ දැනුවත්ව සිටිය යුතු අතර එම රාජකාරී පැවරීම සඳහා කණ්ඩායමක් පුහුණුකර ඒ සඳහා පෙර සූදානම්ව සිටිය යුතු බව ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 18 | විනය පරීක්ෂණ පිළිබඳ තොරතුරු රැස් කිරීම | සියලුම අමාත්‍යාංශ හා අනුයුක්ත ආයතනවල විනය පරීක්ෂණ සම්බන්ධව මේ වන විට කොතරම් විනය පරීක්ෂණ සිදු වෙමින් පවතීද, එම විනය පරීක්ෂණ ආරම්භකර මේ වන විට කොතරම් කාලයක් ගතවී ඇත්ද , ඒවා සඳහා ලබා ගත් තීන්දු තීරණ හා දැනට පවතින තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 19 | කෘෂිකර්ම අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන්ගේ කොන්ත්‍රාත් කාලය දික් කිරීම සම්බන්ධව | කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් තිදෙනෙකු සේවය කරන අතර වාරිමාර්ග අධ්‍යක්ෂ ලෙස සේවය කරන නිලධාරියෙකුගේ කොන්ත්‍රාත් කාලය 2023.05.20 දිනෙන් අවසන්ව ඇති අතර එම නිලධාරියා වැටුප් රහිතව මෙතෙක් සේවය කරන නමුත් ඔහුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත ලිපිය මෙතෙක් ලැබී නැති බවට කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් තම ගැටළුව ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව සියළු තොරතුරු ඇතුලත් කොට ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සඳහා ලිපියක් සකස් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 20 | ඉංජිනේරු අංශයට ලබා දුන් වාහන සම්බන්ධව | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙත ප්‍රධාන ලේකම් කාර්යාලයේ පාලන අංශයේ වාහන දෙකක් ලබා දී ඇති අතර එයින් බියගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය වෙත ලබා දෙන ලද 75-9104 දරන වාහනය දහවල් කාලයේ එම කාර්යාලයට පැමිණ ඇති බවත් ප.ව.4.15 ට පිටව ගිය පසු නැවත එම කාර්යාලයට වාර්තා කර නොමැති බවට අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව නොදන්වා සේවයට වාර්තා නොකිරීම සම්බන්ධව වහාම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 21 | ආපන ශාලාව සම්බන්ධව | ආපන ශලාවේ කටයුතු සම්බන්ධව සෞඛ්‍ය පරීක්ෂක මහතෙකු විසින් මසකට වරක් ආහාර පරීක්ෂා කිරීමට කටයුතු කරන අතර ආහාර පාන කමිටු සාමාජිකයින් එම තනතුර වරප්‍රසාදයක් ලෙස යොදා ගනිමින් තනි තනිව ආහාර පාන පරික්ෂා කිරීම යහපත් තත්ත්වයක් නොවන බවටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
... ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 22 | රියදුරන් සඳහා පුහුණුවක් ලබා දීම සම්බන්ධව | රියදුරන් සඳහා 2023.07.28 දින පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් පුහුණු ) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව එම පුහුණුව ලබා දීමේදී රියදුරන්ගේ ආකල්ප , හැසිරීම් රටාව , තම මාණ්ඩලික නිලධාරියාට ගෞරව කිරීම , නිල ඇඳුම ආදිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් පුහුණු ) වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>තවද රියදුරන් හා කාර්යාල කාර්ය සහයකයින් සඳහා නිල ඇඳුමක් ලබා දී ඇති අතර බොහෝ රියදුරන් මෙන්ම ඇතැම් අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු නිලධාරීන්ද ටී ෂර්ට් ඇඳීමේ ප්‍රවනතාවක් දක්නට ලැබෙන බවත් සැහැල්ලු ඇඳුමෙන් කාර්යාල කටයුතු සඳහා පැමිණීමේ චක්‍රලේඛය මේ වන විට අවලංගු කර ඇති අතර සියලුම නිලධාරීන් කාර්යාල කටයුතු සඳහා වාර්තා කිරීමේදි ටී ෂර්ට් ඇඳීමෙන් වලකින ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් පුහුණු )<br><br>සියලුම අමාත්‍යංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 23 | කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් සිථිර කිරිම සම්බන්ධ ගැටළුව | සේවයට බඳවා ගැනීමේදී අධ්‍යාපන සුදුසුකම් නොමැතිව බඳවාගෙන තිබූ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ සේවකයන් 139 දෙනෙකු සිටින අතර ඔවුන් ස්ථිර කිරිමේ ගැටළුවක් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් පුහුණු ) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව ඔවුන් බඳවාගත් කාලය තුල එම නිලධාරින් වෙනුවෙන් පුහුණු වැඩසටහනක් පවත්වා 26 දෙනෙක් සඳහා ස්ථිර පත්වීම් ලබා දි ඇති බවත් ආණ්ඩුකාර ලේකම් විසින් වැඩි දුරටත් කරුණු දක්වන ලදී.<br>ඔවුන්ට පත්වීම් ලබා දීම ගරු ආණ්ඩුකාරතුමාට සිදුකල හැකි නමුත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා ක්‍රියාවලියේ දී ගැටළුවක් පැන නඟින් බවට ප්‍රධාන නීති නිලධාරී විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>මේ සම්බන්ධව ප්‍රධාන නීති නිලධාරී , ආණ්ඩුකාර ලේකම් ඇතුලු නිලධාරීන් සමඟ සාකච්ඡා කර ගරු ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කර ඒ සඳහා තීරණයක් ලබා දීම සඳහා සියලු තොරතුරු තමා වෙත ලබා දිමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් පුහුණු ) |
| 24 | දිමනා කමිටු තීරණ සම්බන්ධව | ඇතැම් ආයතන විසින් නව දීමනාවන් ලබා ගැනීම සඳහා දීමනා කමිටු වෙත ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි. නමුත් රාජ්‍ය වියදම් කළමනාකරණය සඳහා කටයුතු කරමින් සිටින අවස්ථාවකදී නව දීමනාවන් ඉදිරිපත් කිරීම ප්‍රායෝගික තත්ත්වයක් නොවන අතරම ඒ කිසිදු නව යෝජනාවක් සඳහා කමිටු අනුමැතිය හිමි නොවේ. ඒ අනුව එවැනි ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම ප්‍රායෝගික බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පාලන) විසින් කරුණු සඳහන් කරන ලදී. | සියලුම අමාත්‍යංශ ලේකම්වරු සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 25 | කාර්යාල බස්රථ පිටත්වීම සම්බන්ධව | කාර්යාලීය බස්රථ පිටත්වීම ප.ව.4.30 ක්‍රියාත්මක වන්නේද යන්න ප්‍රධාන ලේකම් විසින් විමසා සිටි අතර පහත මහලේ සවිකර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍ර අසල ප.ව.4.00 සිට නිලධාරීන් රැඳී සිටීම පිළිබඳ තමා නිරීක්ෂණය කර ඇති බව ප්‍රකාශ කරන ලදී.<br>බස් රථ වල ආසන වෙන්කර ගැනීම සඳහා ඇතැම් නිලධාරීන් කාර්යාල වලින් ප.ව.4.00 ට පිටවී පහත මහලේ ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් බැහැර යාම සටහන් කර පිටත්වීමට කටයුතු කරන බව සාකච්ඡා විය.<br>ඒ අනුව ඉදිරියේදී සියලුම නිලධාරීන් බැහැර යාමේදී පහත මහලේ පිහිටි ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකර තම කාරයාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් බැහැර යාම සටහන් කරන ලෙස සියලුම ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>සවස් වරුව තුල පහත මහලේ ඇති සියලුම ඇඟිලි සලකුණු යන්ත්‍ර ක්‍රියා විරහිත කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන ) |
| 26 | මූල්‍ය අංශයේ දැනුවත් කිරීම් | ➢ වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පවත්වනු ලබන Best Annual Report competition තරඟාවලිය පැවැත්වීමට කටයුතු සූදානම්ව ඇති බවත් ඊට අදාළ චක්‍රලේඛ මේ වන විට සියළුම ආයතන වලට යොමු කර ඇති අතර 2023.08.31 දිනට පෙර ඒ සඳහා සියලුම ආයතන ඉදිරිපත් වීමට කටයුතු කරන ලෙසත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය ) විසින් දැනුම් දෙන ලදී.<br>➢ E- Procument වැඩසටහන සඳහා 2023.07.31 සංසරාජ විදුහලේ ඇති තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරියේ පුහුණු ආයතනයේදී වැඩසටහනක් පැවැත්වීමට සූදානම්ව ඇත. එම පුහුණුවට සහභාගී වීම සඳහා සියලුම ආයතන විසින් තම ආයතනය සඳහා නියෝජිතයකු පත්කල යුතු අතර ඒ සඳහා එම දිනට පෙර තම ආයතනය ලියාපදිංචි කර අනතුරුව මාණ්ඩලික නිලධාරියෙකු නම් කර ලියාපදිංචි කර තමා වෙත තොරතුරු ලබා දීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( මූල්‍ය ) විසින් දැනුම් දෙන ලදී.<br>➢ අධ්‍යාපන අමාත්‍යංශයේ විශ්‍රාම වැටුප් සම්බන්ධව ගැටළු පිලිබඳ සාකච්ඡා කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් නිලධාරීන් තිදෙනෙකු සහභාගී වන බව දන්වා ඇති බවත්, විශ්‍රාම වැටුප් ගැටළු පවතින ගොණු 5 ක් පමණ රැගෙන එන ලෙසත් සාකච්ඡා කිරීමට ඇති වෙනත් හඳුනාගත් ගැටළු, සාකච්ඡා කිරීමට සූදානම් කරගෙන එන ලෙසත්, දන්වා ඇති අතර ඒ සඳහා සහභාගී වන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය ) විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.



ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත